NATIONAL CHRISTIAN EVANGELICAL ALLIANCE
SRI LANKA

# කෝවිඩ්-19 සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා නීතිය නියමාකාරයෙන් යොදගැනීම

මෙම සංක්ෂිප්ත ප්‍රතිපත්ති සටහන තුළ, ආදර්ශමත් මහජන සෞඛ්‍ය නීතියක ගුණාංග සහ මහජන සෞඛ්‍ය අර්බුද අවස්ථාවකදී නීතිය යොදගත යුත්තේ කෙසේද යන්න සැකෙවින් දක්වා තිබේ. මෙහි අරමුණ වන්නේ, සියළුදෙනාටම සමාන ලෙස සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව ලබාදීමත් මහජන විශ්වාසය වර්ධනය කිරීමත් වේ.

මෙම සංෂිප්ත ප්‍රතිපත්ති සටහන ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි එවැන්ජලික සංධානය (*NCEASL*) විසින් ආරම්භ කරන ලදී. *NCEASL* හි ජශාන් ජෙගසෝති සහ රොෂෙල් මෝසස්ගේ පර්යේෂණ දයකත්වයෙන් අර්මීසා ටීගල් විසින් එය සම්පාදනය කළ අතර ඊට සහය ලබා දෙන ලද්දේ නීතිඥ ජුවනීටා අරුලානන්දම් විසිනි. එසේම  මේ සඳහා සිය අදහස් උදහස් ලබා දුන් නීතිය හා සමාජ භාරයෙහි සකුන්තලා කදිර්ගාමර් සහ නීතිඥ ෂෙලෝම් ඩැනියල් හට අපි කෘතඥ වන්නෙමු.

ශක්තිමත් සෞඛ්‍යසේවා පද්ධතියකට පහසුකම් සැලසීම සඳහා ශක්තිමත් දේශීය නීතිවල වැදගත්කම ලෝක සෞඛ්‍ය සංවිධානය පිළිගෙන තිබේ. Covid-19 Law Labs (කෝවිඩ්-19 නීති විද්‍යාගාර) දියත් කරමින් ලෝක සෞඛ්‍ය සංවිධානය "දුර්වල අන්දමින් සැලසුම් කළ, ක්‍රියාත්මක කළ හෝ බලාත්මක කළ නීති කොන් වූ ජනකොටස්වලට හානි පැමිණවීමටත් අපකීර්තිය හා වෙනස්කොට සැලකීම තදින් ස්ථාපිත කිරීමටත් වසංගතය අවසන් කිරීමට ගන්නා වෑයම්වලට බාධා ඇති කිරීමටත් හැකි" බව සඳහන් කරන ලදී.[1] මනාව සැලසුම් කර සම්පාදනය කරන නීති ශක්තිමත් සෞඛ්‍ය සේවා පද්ධතියක් ගොඩනැංවීමටත්, සුරක්ෂිත හා ක්‍රියාකාරී ඖෂධ සහ එන්නත් තක්සේරු කර අනුමත කිරීමටත්; වඩාත් සෞඛ්‍ය සම්පන්න හා සුරක්ෂිත පොදු ස්ථාන සහ සේවා ස්ථාන ඇතිකිරීම සඳහා ක්‍රියාමාර්ග බලාත්මක කිරීමටත් උපකාරී විය හැකිය. ශ්‍රී ලංකාවේ මේ සම්බන්ධයෙන් අපට කළ හැකි දෑ බොහෝ ය.

මහජන සෞඛ්‍ය නීති මඟින් සිදුවන්නේ මහජනතාව සහ සෞඛ්‍ය ගැටළු අතර ඇති සම්බන්ධතාවය පාලනය කිරීම යි. අනෙකුත් සියළුම නීති මෙන් මෙම නීති සම්පාදනය කිරීම සඳහා ද ශ්‍රී ලංකාවේ ජනතාව ව්‍යවස්ථාදයකයට බලය පවරා ඇති අතර, එකී නීති යොදගනිමින් රටේ පරිපාලනය සිදුකිරීම සඳහා විධායකයට බලය පවරා ඇත. අධිකරණය මෙකී බලතල නියමාකාරයෙන් සහ ජනතාවගේ යහපත තකා යොදු ගැනෙන්නේදැයි සුපරික්ෂාකාරී වේ.

### මහජන සෞඛ්‍ය අර්බුදයක් අවස්ථාවේදී අවශ්‍ය වන්නේ:

- රෝග නිවාරණය පිළිබඳ පැහැදිලි සහ නිරන්තරයෙන් ලබාදෙන පණිවිඩ
- සෞඛ්‍ය තොරතුරු/සේවා කරා ප්‍රවේශවීම සම්බන්ධයෙන් ලබාදෙන පැහැදිලි සහ නිරන්තර පණිවිඩ
- රෝගය වැළඳුණු පුද්ගලයින් අපකීර්තියට පත් නොකළ යුතු බවට ලබාදෙන පැහැදිලි සහ නිරන්තර පණිවිඩ. ආසාදිත හෝ ආසාදිත බවට සැක කරන තැනැත්තන් සියළුදෙනා රෝගීන් ය. ඔවුන් අපරාධකරුවන් ලෙස නොසැලකිය යුතු අතර, ඔවුන් තනි කිරීම හෝ ඔවුන්ගේ ගරුත්වය අහිමි කිරීම සිදු නොකළ යුතු ය
- මහජන සහය, මේ සඳහා දිරිමත් කළ යුතු ය. දණ්ඩනාත්මක ප්‍රවේශ හානිකර වන අතර ඒවා අධෛර්යමත් කළ යුතු වේ
- ඇති වූ තත්වයේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන සමාජ-ආර්ථික, මානසික සෞඛ්‍ය සහ අනෙකුත් අවශ්‍යතා ඇගැයුම් කිරීම සහ ආමන්ත්‍රණය

# මහජන සෞඛ්‍ය අර්බුද සඳහාම විශේෂිත නීති/ නීතිය



මහජන සෞඛ්‍ය අර්බුද යන සන්දර්භයට ප්‍රතිචාර දක්වන ඒවා විය යුතු ය.

රජයට ක්‍රියාමාර්ග ගැනීමට හැකි කරවන ඒවා විය යුතු ය (නීත්‍යානුකූල හා සුජාතබව සහතික කරගත යුතු ය).

මූලික අයිතිවාසිකම් යම් ආකාරයකින් හෝ සීමා කෙරෙන්නේ නම්, එය මහජන සෞඛ්‍ය අර්බුදයේ තීව්‍රතාවයට සෑහෙන තරමින් පමණක් විය යුතු අතර එය"අළුත් සාමාන්‍ය තත්වය" බවට පත් නොවිය යුතු ය.

## මහජන සෞඛ්‍ය අර්බුදයකට ප්‍රතිචාර දක්වන බලවත් නීති හරහා පහත දෑ සිදුකිරීමට හැකිවිය යුතු ය:

1. සම්බන්ධ කිරීම
2. නියෝජනය කිරීම
3. සන්නිවේදනය
4. ආරක්ෂා කිරීම
5. අවශ්‍ය කරන ව්‍යතිරේඛ නිර්වචනය කිරීම

## 1 විද්‍යාත්මක තොරතුරු මහජන සන්දර්භය සමඟින් සම්බන්ධ කිරීම

සෑම සෞඛ්‍ය අර්බුදයකටම ආවේණික වූ විද්‍යාත්මක තොරතුරු තිබේ. අර්බුදය සිදුවන අතරතුර විද්‍යාත්මක තොරතුරු සොයා ගැනීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පැවතීමට ද ඉඩ තිබේ. විද්‍යාත්මක තොරතුරු ජනතාව සමඟ සම්බන්ධ කිරීමේ කාර්යභාරය සහ වගකීම රජය මත පැටවෙන්නේ මේ හේතුවෙනි. ගැලපෙන සුදුසුකම් හා පළපුරුද්ද ඇති පුද්ගලයින් විසින් මහජනයා සමඟ සම්බන්ධ වීමේ මෙම ක්‍රියාවලිය මෙහෙයවිය යුතුය. සත්‍යාපනය කළ තොරතුරු හැකි ඉක්මනින් හා සාමාන්‍ය මිනිසුන්ට අවබෝධ කරගත හැකි භාෂාවකින් බෙදා හදා ගත යුතු ය. තොරතුරු මහජනතාවගේ ඒ ඒ පසුබිම්වලට ද අදාළ විය යුතු අතර, අධ්‍යාපන අංශය, ප්‍රවාහන අංශය, කම්කරු අංශය, කෘෂිකාර්මික අංශය, වැවිලි අංශය වැනි ක්ෂේත්‍රවල ප්‍රවීණයන්ට එම අංශවලට සහ එම අංශවල පුද්ගලයින්ට මෙම තත්වය කෙසේ බලපානු ඇති ද, සියළුම ක්ෂේත්‍රවල පුද්ගලයින් ආරක්ෂා කර ගැනීමට වඩාත් උචිත වන්නේ කුමන ක්‍රියාමාර්ග ද යනාදිය සම්බන්ධයෙන් අදාළ අංශවලටම විශේෂිත දැනුම ලබාදෙන්නට හැකිවනු ඇත්තේ එවිට ය.



## 2 සියළු දෙනාට පැහැදිලිව සන්නිවේදනය කිරීම - ජනතාව දැනුවත් කිරීම සහ ජනතාවට සවන්දීම



මහජන සෞඛ්‍ය පණිවිඩ මහජනතාවගේ සියලුම අංශ කරා ළඟා විය යුතු ය. ආදයම, ආහාර, පොලිස් ස්ථාන, රෝහල්, ප්‍රවාහන, ප්‍රජනන සෞඛ්‍ය සේවා වැනි මහජන සෞඛ්‍ය ක්‍රියාමාර්ගවල ප්‍රතිඵල විවිධ පුද්ගල කණ්ඩායම්වලට වෙනස් ලෙස බලපායි. ඇතැම් කණ්ඩායම් වඩාත් අවදානමට ලක්ව ඇති අතර ඔවුන්ගේ අවශ්‍යතා ගැන සැලකිලිමත් විය යුතු ය. තීරණ ගැනීමේ දී නිසි නියෝජනයක් තිබීම වැදගත්වන්නේ මේ හේතුවෙනි. මෙමඟින් සියලුම සේවා සියලු පුද්ගලයින් වෙත ළඟා වන බව සහතික කෙරේ. ගනු ලබන තීරණ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් කෙරෙහි අහිතකර ප්‍රතිඵල ගෙන ඒමට ඉඩ ඇතැයි අපේක්ෂා කරන බව ද එය සහතික කරයි. සමස්තයක් වශයෙන්, මෙමඟින් ජනතාව සහ ඔවුන්ගේ ජීවිත පරිපාලනය කරන පද්ධති අතර විශ්වාසය වැඩි දියුණු කරයි.

## 3 සියළු දෙනාට පැහැදිලිව සන්නිවේදනය කිරීම - ජනතාව දැනුවත් කිරීම සහ ජනතාවට සවන්දීම

නීති විවෘතව සම්පාදනය කර ජනතාව අතරේ මනා සේ බෙදා හැර තිබිය යුතු වේ. මහජනතාවට නීතිය අවබෝධ කරගැනීමටත් භාවිතයටත් පහසුවන අන්දමින් සරල බසින් නීති සම්පාදනය කිරීම නවීන නැඹුරුවක් බවට පත්වී තිබේ. මහජන සෞඛ්‍ය නීති, පහසුවෙන් ප්‍රවේශ විය හැකි සහ අවබෝධ කරගත හැකි ඒවා විය යුතු ය. රජයෙන් මහජනතාවට ලබාදෙන තීරණ හා උපදෙස් කවරේද යන්න සරල භාෂාවෙන් ලබාදීම තුළින් මහජනතාවට ඒවා අවබෝධ වන බව සහතික කරගත යුතු යැයි ද මහජන සෞඛ්‍ය නීති හරහා නියම කළ හැකි ය. නීති මඟින් මහජනතාව පීඩාවට පත් නොවිය යුතු ය.

එනම්, නීති සහ නියෝග සියළුම දේශීය භාෂාවලින් ලබාගත හැකි විය යුතු අතර ඒවායේ අන්තර්ගත භාෂාව හරහා අදාළ පණිවුඩය සරල බසින් සන්නිවේදනය විය යුතු ය.



## 4 මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

අර්බුද සමයක මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමට ඇති ඉඩකඩ ඉහළ ය. පෞද්ගලික පුරවැසියන් වශයෙන් මෙන්ම රාජ්‍ය ක්ෂේත්‍රයේ සේවකයින් වශයෙන් ජනතාව අසාමාන්‍ය තත්වයන්ට මුහුණ දීම තුළ ඒවා සඳහා ඔවුන් සාමාන්‍ය රාමුවෙන් පරිබාහිරව ප්‍රතිචාර දැක්වීම ඊට හේතුව වේ. බිය, දැඩිසේ කලබල වීම හා පාලනය ගිලිහී යාම තුළ පමණ ඉක්මවූ පාලන බලයක් හෝ අත්තනෝමතික ක්‍රියාමාර්ග ගැනීමට වෑයම් දරන රජයන් හෝ හාම්පුතුන් විසින් දරුණු ක්‍රියාමාර්ගවලට යොමුවීමට ඉඩ තිබේ. ඇතිව තිබෙන අතිවිශේෂ තත්වය කුමක් වුවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර දී ඇති මූලික අයිතිවාසිකම් තවදුරටත් සියළු දෙනාට බලපවත්වන මූලික රාමුව ලෙස පවතියි. පුද්ගලයින් කිසිදු අවස්ථාවකදී වධහිංසාවට හෝ අවමන් සහගත සැලකිලිවලට භාජනය නොකරනු ඇති බවත්, සිතීමේ නිදහස අහිමි කිරීමට ලක් නොකරනු ඇති බවත්, සෑමවිටම සමානව සලකනු ඇති බවත් , අත්තනෝමතික ලෙස ඔවුන් සිරභාරයට ගැනීම හෝ රඳවා තැබීම නොකරනු ඇති බවත්, ඔවුන්ට සෑම විටම තම අදහස් පලකිරීමට, තමන්ගේ ආගම ප්‍රගුණ කිරීමට හැකිවනු ඇති බවත් තොරතුරු සඳහා ඔවුන්ට ප්‍රවේශ විය හැකි වනු ඇති බවත් සහතික කෙරෙන්නේ එමඟින් වේ.



මහජනතාව තමන්ගේම රටේ, තමන්ගේම රජය අතින් දුක්පීඩාවලට පාත්‍ර නොවන බව සහතික කරගැනීම සඳහා මූලික අයිතිවාසිකම් ආරක්ෂා කරදීම වැදගත් වේ. ඒවා උල්ලංඝනය කිරීමෙන් ජනතාවට දීර්ඝ කාලීන බලපෑම් එල්ලවන අතර රටේ ජනතාව සහ පරිපාලන පද්ධතිය අතරේ ඇති විශ්වාසය බිඳ දමනු ලැබේ.

## 5 අවශ්‍ය කරන ව්‍යතිරේක නිර්වචනය කිරීම - බලය යොදගැනීම හෝ අනිවාර්ය කිරීම අවශ්‍ය වන්නේ කුමන අවස්ථාවලද සහ රජයේ කුමන ක්‍රියා සුදුසු වනු ඇත්ද යන වග පැහැදිලිව දැක්වීම

සාමාන්‍ය තත්වය අභිබවා ගිය තත්වයන් සඳහා සාමාන්‍ය තත්වය අභිබවන බලයක් අවශ්‍ය වේ. උදහරණ වශයෙන්, අපරාධ වරදක් සිදුකර නොමැති තැනැත්තෙක් බලයෙන් රඳවා තබාගැනීම නීතියට පටහැණි ය. එහෙත්, වසංගත තත්වයක් යටතේ, අනෙක් පුද්ගලයින්ට රෝගය ආසාදනය කළ හැකි පුද්ගලයකුව බලහත්කාරයෙන් රඳවා තබාගැනීම සඳහා අතිවිශේෂ බලයක් නොහොත් නීරෝධායනය සඳහා බලය ලැබේ. රජයක් මෙවැනි අතිවිශේෂ බලතල භාවිතා කිරීමේදී, එකී බලතල නීත්‍යානුකූල වශයෙන් වලංගු බවත් එය අවශ්‍ය බවත්, එම අවස්ථාවට ප්‍රමාණාත්මකව සරිලන බවත් රජය විසින් පෙන්නුම් කළ යුතු වේ. එවිට, අත්තනෝමතික ලෙස බලතල යොදගැනීම තුළ රජයක ක්‍රියාවන් සීමාව ඉක්මවා යාම සිදු නොවන බව සහතික කරගත හැකිය. අතිවිශේෂ අවස්ථා පාලනය කරන නීතිවලට බලය අනිසි ලෙස යොදු නොගන්නා බව සහතික කිරීම සඳහා මඟ පෙන්වීම්, නිර්ණායක සහ සීමා ලබා දීමට හැකි ය. මෙසේ මඟ පෙන්වීම, නිර්ණායක ඇතිකිරීම සහ සීමා ඇති කිරීම තුළ තමන් විසින් බලතල යොදගත යුත්තේ කෙසේද යන්න රාජ්‍ය නිලධාරීන්ට අවබෝධ කරගත හැකි වනු ඇති අතර, අපේක්ෂා කළ යුත්තේ කුමක්ද සහ තාවකාලිකව ඔවුන්ගේ ඇතැම් අයිතිවාසිකම් සීමා කරන්නට සිදුව ඇත්තේ ඇයිද යන්න මහජනතාවට අවබෝධ කරගත හැකි වේ. තමන්ගේම රජය විසින් තමන්ට කෙනෙහිලිකම් කරන බවත් ජනතාවට නොහැඟීම සඳහා මෙම අවබෝධය ඉතාමත් වැදගත් වේ.



## වසංගත සම්බන්ධයෙන් දැනට පවතින නීති රාමුව

දැනට පවතින නීති අතරින් මෙම තත්වයට වඩාත්ම අදළ වන්නේ 1897 නිරෝධායන සහ රෝග වැලැක්වීමේ ආඥපනත සහ 2005 ආපද කළමනාකරණ පනතයි.

| | 1897 නිරෝධායන සහ රෝග ව්‍යාප්තිය වැළැක්වීමේ ආඥපනත | 2005 අංක 13 දරන ආපද කළමනාකරණ පනත |
|---|---|---|
| නීතිමය රාමුව | මෙම නීතියේ අරමුණ වන්නේ බෝවන සහ ආසාදක රෝග ව්‍යාප්තිය වැළැක්වීමයි. මේ සම්බන්ධයෙන් පුළුල් පරාසයක විෂයයන් සඳහා රෙගුලාසි සෑදීමට එමගින් අමාත්‍යවරයාට අවසර ලබාදෙයි.<br><br>• විවිධ ද්‍රව්‍ය සහ ස්ථානවල සනීපාරක්ෂක තත්වය පවත්වාගැනීම<br>• බෝවන රෝග පැතිරයාම වැළැක්වීමේ අරමුණින් පුද්ගලයින් සහ ද්‍රව්‍ය නිරෝධායනය කිරීම. මීට පෙර, පුළුල් පරාසයක විෂයයන් සම්බන්ධයෙන් එසේ විවිධ රෙගුලාසි පනවා ඇත. | මෙම නීතියේ අරමුණ වන්නේ වසංගත ඇතුළුව ස්වභාවික හෝ මිනිසා විසින් ඇතිකරන ලද ආපද සඳහා ප්‍රතිචාර දැක්වීම පිණිස සැලසුම් කරන ලද සහයෝගී හා නියෝජනාත්මක රාජ්‍ය යන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමයි. එමඟින් (අ.) ජාතික ආපද කළමනාකරණ මණ්ඩලය සහ (ආ.) ආපද කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටවනු ලැබේ.<br><br>නීතියෙන් පහත කටයුතු සඳහා විධිවිධාන සලසා ඇත:<br>• ආපද තත්වයක් ඇතිවී තිබෙන බව ප්‍රකාශයට පත් කිරීම (පාර්ලිමේන්තුවේ අනුමැතියෙන් සිදුකරන නිවේදනයක් හරහා)<br>• ආපද වැළැක්වීම හා ඒවායින් ඇතිවන හානි අඩු කිරීම සඳහා ද, සහන සැලසීම සඳහා ද වන වැඩසටහන් සඳහා මුලපිරීම<br>• ප්‍රදේශයේ සහ ප්‍රජාවේ ස්වශක්තිය සඳහා පහසුකම් සැලසීම හා සහය වීම<br>• රාජ්‍ය නොවන සංවිධාන සමඟින් සහයෝගීතාවයෙන් වැඩ කිරීම |
| 2020 මාර්තු සිට අගෝස්තු දක්වා කාලය තුළ මෙම නීතිය යටතේ ගෙන ඇති නීත්‍යානුකූල ක්‍රියාමාර්ග | 2020 මාර්තු මස 20 වැනි දින සෞඛ්‍ය අමාත්‍යවරයා නව කොරෝනා වෛරසය නිරෝධායනයට ලක් කළ යුතු රෝගයක් වශයෙන් ගැසට් කරමින් එම වෛරසය ආසාදනය වූ හෝ ආසාදිත බවක් සැක කරන තැනැත්තන්ව නිරෝධායනයට නතු කිරීම අනිවාර්ය කරන ලදී.<br><br>2020 මාර්තු මස 25 වැනි දින සෞඛ්‍ය අමාත්‍යවරයා සමස්ථ ශ්‍රී ලංකාව සඳහාම 'නිසි බලධරයා' වශයෙන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල්වරයා පත් කිරීම ද ඇතුළුව විවිධ භූගෝලීය ප්‍රදේශ සඳහා 'නිසි බලධරයින්' පත් කිරීම සහ තවත් කාරණා වෙනුවෙන් පෙර පැවති රෙගුලාසි සංශෝධනය කළේය.[1] 2020 අප්‍රේල් 11 වැනි දින සෞඛ්‍ය අමාත්‍යවරයා කෝවිඩ්-19 හේතුවෙන් මියගිය තැනැත්තන්ගේ සිරුරු ආදහනය කළ යුතු යැයි නියෝග කළේය.[2] කෝවිඩ්-19 සඳහාම විශේෂිත රෙගුලාසි මාලාවක් නීතිගත කර නොමැත. | |

*[1] 2020 මාර්තු 25 දරන (අතිවිශේෂ ) ගැසට් අංක 2168/6*

*[2] 2020 අප්‍රේල් 11 දරන (අතිවිශේෂ ) ගැසට් අංක 2170/8*

**මහජන සෞඛ්‍ය සඳහා නොවන නීති** යොදගත හැක්කේ සාමාන්‍ය පරිදි පොලීසිය මඟින් මහජන සාමය පවත්වාගෙන යා නොහැකි විට සහ එය උල්ලංඝනය වන විට සහ එවැනි උල්ලංඝනයක් අත්‍යාසන්න වූ විට පමණි. කෙසේ නමුත් නීතිය හා සාමය ආරක්ෂා කිරීම සහ ආරක්ෂාව කෙරෙහි දැඩි අවධානයක් සහිත මෙම නීති, මහජන සෞඛ්‍ය හා සුබසෙත හා සම්බන්ධ අර්බුදයකට ප්‍රතිචාර දැක්වීමේදී එතරම් සුදුසු නොවේ.

| | දණ්ඩ නීති සංග්‍රහය | 1947 මහජන ආරක්ෂා ආඥාපනත |
|---|---|---|
| නීතිමය රාමුව | දණ්ඩ නීති සංග්‍රහයේ 14 පරිච්ඡේදයේ මහජන සෞඛ්‍ය සහ සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් වන වරද පිළිබඳව සඳහන් වේ.<br><br>දණ්ඩ නීති සංග්‍රහයේ 261 වගන්තියේ මෙසේ සඳහන් වේ:<br>මහජනතාවට හෝ, ඒ ආසන්නයේ පදිංචි හෝ දේපළ භුක්ති විඳින පුද්ගලයින්ට පොදුවේ හානි, අනතුරු හෝ කරදර ඇති වන පරිද්දෙන් හෝ, ඕනෑම පොදු අයිතිවාසිකමක් භුක්ති විඳීමට අවස්ථාව ඇති පුද්ගලයින්ට නොවැළැක්විය හැකි පරිදි හානි, බාධා, අනතුරු හෝ කරදර ඇතිවන පරිද්දෙන් ඕනෑම ක්‍රියාවක් හෝ නීති විරෝධී නොකර හැරීමක් සඳහා වරදකරුවකු වන ඕනෑම පුද්ගලයකු මහජන කරදරය යන වරද සඳහා වරදකරුවකු වේ. එමඟින් යම් පහසුවක් හෝ වාසියක් වේය යන හේතුව මත මහජන කරදරය සඳහා සමාව දෙනු නොලැබේ.<br><br>දණ්ඩ නීති සංග්‍රහයේ 261 වගන්තියේ මෙසේ සඳහන් වේ:<br>ජීවිතයට අන්තරායයක් විය හැකි ඕනෑම රෝගයක් පැතිරයාමට හේතු විය හැකි බවක් තමන් විසින් දන්නා, හෝ එසේ විය හැකි යැයි විශ්වාස කිරීමට හේතු ඇති ක්‍රියාවක නීති විරෝධී අන්දමින් හෝ නොසැලකිලිමත් අන්දමින් නිරතවන ඕනෑම තැනැත්තකු මාස හයක් දක්වා වූ සිරදඬුවමකින් හෝ දඩයකින් හෝ ඒ දෙකෙන්ම හෝ දඬුවම් කිරීමට ලක් විය හැක. | මහජන ආරක්ෂාව සඳහා සහ මහජන සාමය ආරක්ෂා කිරීම සඳහා හෝ ප්‍රජාවගේ ජීවිතය සඳහා අත්‍යාවශ්‍ය සැපයුම් සහ සේවා පවත්වාගෙන යාම සඳහා හදිසි අවස්ථා තත්වයක් උදවී ඇති බව හෝ උදවන බව ගැසට් නිවේදන හරහා ප්‍රකාශයට පත්කිරීමට ජනාධිපතිවරයාට මෙම විධිවිධාන හරහා හැකි වේ.<br><br>පාර්ලිමේන්තුවෙන් අනුමත කළහොත් මිස, එවැනි ප්‍රකාශයක් වලංගු වන්නේ මාසයක් සඳහා පමණි.<br><br>ජනාධිපතිවරයාට මේ යටතේ කළහැකි දෑ:<br>• මහජනයාගේ ආරක්ෂාව උදෙසා සහ මහජන සාමය උදෙසා හදිසි අවස්ථා රෙගුලාසි පැනවීම<br>• මහජන සාමය පවත්වාගෙන යාම සඳහා, ගැසට් පත්‍රයේ පලකරන නිවේදනයක් හරහා ඇඳිරි නීතිය පැනවීම<br>• මහජනතාවගේ යහපත තකා අවශ්‍ය වන සහ ප්‍රජාවේ ජීවිතය සඳහා අත්‍යාවශ්‍ය වන සේවාවන් සම්බන්ධයෙන්, ගැසට් පත්‍රයේ පල කරන නිවේදනයක් හරහා එම සේවා අත්‍යාවශ්‍ය සේවා වශයෙන් ප්‍රකාශයට පත් කිරීම |

# ශ්‍රී ලංකාවට විශේෂ වූ නිර්දේශ

2020 මාර්තු මස සිට 2020 සැප්තැම්බර් මස දක්වා ක්‍රියාවෙහි යොදවනු ලැබූ නෛතික හා ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ඇගැයුම් කර, මෙම නිර්දේශ සිදුකරනු ලැබේ. මෙම ලේඛනයේ මුල් කොටසෙහි සාකච්ඡා වූ මහජන සෞඛ්‍ය නීති රාමු ආදර්ශය අනුව යමින් මෙම නිර්දේශ හැඩගස්වා තිබේ.

## 1 ගැලපෙන නීති සම්පාදනය හා යොදාගැනීම



ශ්‍රී ලංකාවේ නිරෝධායන ආඥා පනත පුළුල් අර්ථ දනවන වදන් යොද නිර්මාණය කර තිබේ (මෙය, යටත්විජිත සමයේ නීතිවල ලක්ෂණයකි ) මෙම වර්තමාන වසංගතය සඳහා යොදගන්නේ නම්, එය යාවත්කාලීන විය යුතු අතර, විශේෂයෙන්ම අවදනම්පාත්‍ර අංශවලට තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ නිසි නියෝජනයක් සහතික කරගැනීම සඳහා එය සංශෝධනය කළ යුතු වේ. උදහරණ වශයෙන්, සෞඛ්‍ය අමාත්‍යවරයාගේ තීරණ දැනුවත් කිරීම සඳහා සහ උපදේශක සභාවක් ඇති කිරීමටත් එම සභාව තුළ කාන්තා, අඩු ආදයම් නිවාස, කුලීවැඩ කරන්නන්, වියපත් තැනැත්තන්ගේ අයිතිවාසිකම් නියෝජනය කරන වියපත් අය, ආබාධිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් නියෝජනය කරන ආබාධිත තැනැත්තන්, කම්කරු ක්ෂේත්‍රය නියෝජනය කරන ශ්‍රමිකයින්, වතු ක්ෂේත්‍රය නියෝජනය කරන ශ්‍රමිකයින්, අධ්‍යාපන ක්ෂේත්‍රයෙන්, කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයෙන් යනාදී ක්ෂේත්‍රවලින් නියෝජනය ඇති බව සහතික කරගැනීමටත් කටයුතු කිරීම.

පුළුල් අර්ථ දනවන වදන් යොදගැනීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් පුළුල් ක්‍රියාමාර්ග පරාසයක් සඳහා රෙගුලාසි නිර්මාණය කිරීමට හැකිය. කෝවිඩ්-19 සඳහා විශේෂිත රෙගුලාසි ඊට අදළව ගත යුතු ක්‍රියාමාර්ග සවිගැන්වීමට හැකිවන පරිදි පැනවීමට අවශ්‍ය වේ. එසේ නැතහොත් එම ක්‍රියාමාර්ගවලට නෛතික පදනමක් නොමැතිවනු ඇත.



රෙගුලාසි සෑදීමේදී ඒවා:

**සම්බන්ධතාවයකින් යුක්ත විය යුතු ය** (විද්‍යාත්මක පදනමක් තිබිය යුතු ය)

**සන්නිවේදනය කළ යුතු ය** (මහජනතාව දැනුවත් කරන සහ මහජනතාවට සවන් දෙන අන්දමේ මහජන සන්නිවේදනයක් සඳහා විධිවිධාන සැලසිය යුතු ය)

**ආරක්ෂා කළ යුතු ය** (ජනතාව සහ ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය රාජ්‍ය නිලධාරීන්ට අවධාරණය කළ යුතු ය)

**අවශ්‍ය ව්‍යතිරේක නිර්වචනය කළ යුතු ය** (උදහරණ වශයෙන්, ගමනාගමනය සීමා කළ හැක්කේ කා විසින්ද සහ කොපමණ කාලයක් සඳහා ද යන වග)

විකල්පයක් ලෙස, කෝවිඩ්-19 ආමන්ත්‍රණය සඳහා විශේෂ නවීන නීති පැනවීමට හැකි ය. එවන් විශේෂ නීතියක් පනවන්නේ නම්, ඊට උචිත 'හිරු බැස යාමේ' වගන්තියක්, එනම්, එකී නීතිය බලාත්මක වීම අවසාන වන දිනයක් හෝ කොන්දේසියක් නියම කෙරෙන වගන්තියක් ඇතුළත් කළ යුතු වේ. එම විශේෂ නීතිය, ඉහත කී පරිදි සම්බන්ධතාවයකින් යුක්ත වීම, සන්නිවේදනය, නියෝජනය, ආරක්ෂා කිරීම සහ අවශ්‍ය ව්‍යතිරේක නිර්වචනය කිරීම යන ලක්ෂණවලින් සමන්විත විය යුතු ය. විශේෂ නීතිවලට පුළුල් අභිමතානුසාරී බලතල ඇතුළත් වන අතර, එවන් බලතල අදාළ කරගැනීම අත්‍යාවශ්‍යම වන කාල සීමාව සඳහා පමණක් සීමා විය යුතු ය. සාමාන්‍ය තත්ත්ව යටතේ පමණ ඉක්මවා යන බලතල යොදා ගැනීම, එනම්, ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම උල්ලංඝනය වළක්වා ගැනීමට මෙයින් හැකිවනු ඇත.

## 2 සහන යන්ත්‍රණ සඳහා විධිවිධාන සැලසීම

### 2.1 අධිකරණ සඳහා ප්‍රවේශය සහතික කිරීම:

සුරක්ෂිතභාවය, මුල්‍යමය නඩත්තුව මෙන්ම පුද්ගලයකුගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා මෙය වැදගත් වේ. එසේම, විශේෂයෙන්ම හදිසි අවස්ථා තත්ත්ව යටතේ පවා, අධිකරණ පෙර සේම පවත්වාගෙන යන බවත්, මහජනතාව සමඟින් සම්බන්ධ වන බවත්, ප්‍රවේශය හා සුරක්ෂිතභාවය සම්බන්ධ ක්‍රියාමාර්ග නොවෙනස්ව පවත්වාගෙන යන බව සහතික කරගැනීමට අවශ්‍ය පියවර ගන්නා බවත් (උදා: දුරස්ථ අධිකරණ නඩු විභාග පැවැත්වීම වැනි, සීමිත අවස්ථාවල සිදුකර ඇති ක්‍රියාමාර්ග ගැනීම) සහතික කරගැනීම ඉතා වැදගත් වේ. මහජනතාව වෙත පණිවුඩ දීම සහ ඉදිරිපත් කරන පැමිණිලි හා සළකා බැලිය යුතු කරුණු භාර ගැනීම මහජන සන්නිවේදන ක්‍රමෝපායේම කොටසක් විය යුතු ය.



මහජන සෞඛ්‍ය අර්බුදයක් අතරවාරයේ නඩු මාර්ගයට අවතීර්ණ වූ තැනැත්තන්ට නෛතික කරුණු ගොනු කිරීමේදී මුහුණ දෙන්නට සිදුවන නොවැළැක්විය හැකි දුෂ්කරතා අභිමුව, එනම්, යම් යම් අයදුම් සිදුකිරීමට පනවා ඇති කාල සීමාවන් වැනි සීමාකිරීම් මෙවන් කාලයකදී පැහැදිලි ලෙසම ලිහිල් කිරීම අවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ සන්දර්භය ගත් කල, එක් මාසයක කාල සීමාවක් නියම වී ඇති මූලික අයිතිවාසිකම් අයදුම් සම්බන්ධයෙන් මෙය විශේෂයෙන්ම වැදගත් වේ. මූලික අයිතිවාසිකම් සහ රිට් අයදුම් සඳහා නිසි කලට සහන ලබාගත හැකි නම්, එය රජයේ ක්‍රියාවන් සඳහා වැදගත් සංවරණයක් වශයෙන් කටයුතු කරයි. විශේෂයෙන්ම, සුළුතර කණ්ඩායම්වල හා අවදනම් පාත්‍ර ප්‍රජාවන්හි අයිතිවාසිකම් ආරක්ෂා කරදීම සඳහා එය ප්‍රයෝජනවත් වේ.

## 3 ප්‍රතිචාරී සහ වගකියන ප්‍රතිපත්ති අනුගමනය කිරීම

### 3.1 ක්‍රමයෙන් විකාශය වන සමාජ ආර්ථික සහන ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම:



මෙවන් වසංගත තත්වයක් තුළ ඇතිවන ආර්ථික බලපෑමට ආහාර සහනාධාර ලබා දීම, ගෙවල්කුලී සහනාධාර ලබාදීම, මෙම පසුබිමට උචිත සනීපාරක්ෂක පහසුකම් ලබා දීම (විශේෂයෙන්ම නිසි නිවාස පහසුකම්  නැති අයට), ප්‍රජනන සහ සෞඛ්‍ය සේවා ලබා දීම, ශ්‍රමය හා බැඳුනු ආරක්ෂණ සලසා දීම සඳහා වන අවශ්‍යතා ඇතුළත් වේ. මහජන සෞඛ්‍ය නීති රාමුව තුළ මෙය පිළිගැනීමට ලක් කළ යුතු වන අතර, එම එක් එක් විශේෂිත අවශ්‍යතා උද්ගත වන කල්හි ඒවා ආමන්ත්‍රණය සඳහා අනෙකුත් රාජ්‍ය ආයතන සමඟින් සම්බන්ධ වී සහයෝගීතාවයෙන් කටයුතු කළ යුතු වේ. ලබා දෙන ප්‍රතිචාර නිසි කලට සහ සාක්ෂි මත පදනම් වෙමින් ලබා දෙන බව නීතියෙන් සහතික කරගත යුතු වේ. එසේම, අදාළ නීති සහ යන්ත්‍රණ, මෙම සෞඛ්‍ය අර්බුදය ඇති වීමට පෙරාතුව පවා ආර්ථික වශයෙන් අවදානම්පාත්‍ර තත්වයේ පසු වූ සහ, මේ සමඟින් තවදුරටත් අවධානම්  අධියකට වැටී සිටින පුද්ගලයින් සහ ප්‍රජාවන්, එනම්, ශ්‍රී ලංකාවේ තේවතු ආශ්‍රිතව සේවය කරන ශ්‍රමිකයින් වැනි තැනැත්තන් සඳහා මෙහිදී ප්‍රමුඛතාවය ලබාදීම වැදගත් වේ.

### 3.2 ආරක්ෂක ප්‍රවේශයක් අනුගමයෙන් වැලකීම:

මහජන සෞඛ්‍ය ප්‍රතිචාරයන්හි දී රජය ඒ සඳහා යොමු කිරීමටත් රජයේ ප්‍රතිචාරයෙහි පොදු  මුහුණුවර වීමටත් මහජන සෞඛ්‍ය නිලධාරීන්  විසින් කටයුතු කල යුතු වේ. සිවිල් සබඳතා ක්‍රියාත්මක කරන ප්‍රධාන ආයතනය පොලීසිය යි. සිවිල් කටයුතු සඳහා හමුදව යෙදවීම වෙනත් ක්‍රියාමාර්ගයක් නොමැති තැන ගන්නා අවසාන ප්‍රතිචාරය විය යුතු අතර, එවන් අවස්ථාවල පවා, එය සීමිත සහ අවශ්‍ය කරන ක්‍රියාමාර්ග සඳහා පමණක් අදළ වන පරිදි
සිදුකළ යුතු වේ. මහජන සෞඛ්‍ය හදිසි අවස්ථාවකදී ප්‍රතිචාර දක්වන්නට ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපායයක් මතම, විශේෂයෙන්ම හමුදව සම්බන්ධ වන ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපායයක් මත තදබල ලෙස යැපීම තුළ කෙටි කාලීන සහ දීර්ඝ කාලීන ප්‍රතිවිපාක ඇතිවිය හැකිය. කෙටිකාලීනව, රෝගීන් වාර්තා නොකර සිටීමට පෙළඹීම ද දීර්ඝ කාලීනව මහජන විශ්වාසය පළුදු වී යාමට ද එය හේතු විය හැකිය.

## 3.3 සමාජ සබඳතා ශක්තිමත් කිරීමට මාධ්‍ය සහ පෞද්ගලිකත්වය සඳහා ගරුකිරීම යොදා ගැනීම

කෝවිඩ්-19 තත්වය අතරතුර සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් නිකුත් කළ මාර්ගෝපදේශ මෙසේ වේ:

- COVID-19 පිළිබඳ සත්‍යාපිත හා නිවැරදි තොරතුරු පමණක් වාර්තා කරන්න
- COVID-19 ආසාදනය වූ පුද්ගලයින්ගේ හෝ එයින් මිය යන අයගේ ජාතිය හෝ ආගම ගැන සඳහන් නොකරන්න
- COVID-19 ආසාදිතයන් රෝගයේ වාහකයන් / සම්ප්‍රේෂකයන් ලෙස නොව රෝගීන් ලෙස හඳුන්වන්න
- විවිධ පුද්ගලයින්ගේ පෞද්ගලික අදහස් මත නොව තාක්ෂණික හා විද්‍යාත්මක කරුණු පදනම් කරගනිමින් වාර්තාකරණය සිදුකරන්න
- COVID-19 ආසාදිතයින්ගේ අවසරයකින් තොරව ඡායාරූප පළ කිරීම හෝ වීඩියෝ පෙන්වීම නොකරන්න
- COVID-19 හේතුවෙන් මියගිය අයගේ අවමංගල්‍ය උත්සවවලදී ගන්නා ලද සංවේදී ස්වභාවයේ වීඩියෝ දර්ශන පෙන්වන විට, වීඩියෝ බොඳ කිරීම වඩාත් සුදුසුය
- මිනිසුන් අතර වෛරය ඇති කරන අයුරින් වාර්තා නොකරන්න
- රෝගය සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ජනතාව අතර සහයෝගීතාවය සහ සහයෝගය ගොඩනැගීම සඳහා COVID-19 පිළිබඳ ධනාත්මක ආකාරයකින් වාර්තා කරන්න

ඕනෑම මහජන සෞඛ්‍ය අර්බුදයකදී මෙවැනි මාර්ගෝපදේශ අනුගමනය කිරීම වඩාත් සුදුසු වන බව නිර්දේශ කෙරේ. රාජ්‍ය මාධ්‍ය විසින් මේ සම්බන්ධයෙන් වන යහපරිචයන් ආදර්ශනය කර පෙන්විය යුතු අතර සාධනීය නොවන පුවත් මැඩලීම සඳහා නිසි පුවත් වාර්තා ඉදිරිපත් කළ යුතු ය.



## 3.4 සඵලදායී මහජන සන්නිවේදන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම:

රජය හා මහජනතාව අතර සඵලදායී සන්නිවේදනයක් පැවතීම වැදගත් වේ. ඒ සඳහා පහත දෑ නිර්දේශ කරනු ලැබේ:

- පැහැදිලි, සරල බසින් ලියැවුනු අදාළ නීති, රෙගුලාසි හා මාර්ගෝපදේශ රටේ භාෂා සියල්ලෙන්ම සියළු ප්‍රධාන මාධ්‍ය ආයතන හා සමාජ මාධ්‍ය හරහා පුළුල් ලෙස ප්‍රචාරණය කළයුතු වේ.

- රජයේ නිලධාරීන්ට දුක්ගැනවිලි හා ගැටළු සන්නිවේදනය කිරීම සඳහා සහ මහජනතාවගේ ප්‍රතිපෝෂණ සහ පැමිණිලි සඳහා පහසුකම් සැලසීම සඳහා මහජන සංවාද යන්ත්‍රණ සකස් කළ යුතුය. සිවිල් කාර්යයක් වන මෙය, අනිවාර්යයෙන්ම රටේ භාෂා සියල්ලෙන්ම දයානුකම්පිතව සන්නිවේදනය කළ හැකි සිවිල් පරිපාලකයින් විසින් මෙහෙයවිය යුතු අතර හමුද නිලධාරීන් සම්බන්ධ කර නොගත යුතුය.

- තොරතුරු බෙද හැරීම සඳහා සහ මහජනතාවගේ ප්‍රතිපෝෂණ ලැබීමට හා ඒවාට ප්‍රතිචාර දැක්වීමට පළාත් පාලන නිලධාරීන්ට අධ්‍යාපනය, පුහුණුව සහ මාර්ගෝපදේශ ලබාදිය යුතුය. ලබා දී ඇති රාමුවක් තුළ ප්‍රතිචාර රටට ඔබින සේ හැඩගැස්වීම තොරතුරු සඵලදායී ලෙස බෙද හැරීම සහ මිනිසුන් සමඟ සඵලදායී ලෙස සම්බන්ධ වීම සඳහා වැදගත් පියවරකි.

- සුදුසු මහජන සෞඛ්‍ය බලධාරියකු විසින් පවතින මහජන සෞඛ්‍ය තත්වය පිළිබඳ සත්‍ය තත්වය කියැවෙන, යාවත්කාලීන කළ තොරතුරු වරින් වර නිකුත් කෙරෙන බව රජය විසින් සහතික කරගත යුතු වේ (උද: බෝවීමේ අනුපාතය, නිරෝධායනය කළ ප්‍රදේශ, සංචලනය සීමා කිරීම් යනාදිය පිළිබඳව). විශ්වසනීය තොරතුරු රජයෙන් ලබාගත හැකි වීම තුළ වැරදි සහ ඇතැම් අවස්ථාවල සිතාමතාම යම් කිසි සුළුතර කණ්ඩායමක් හෝ එවැනි වෙනත් අවදනම්පාතු කණ්ඩායමක් හෝ පුද්ගලයකු ඉලක්ක කරගනිමින් සිදුකරන පුද්ගලයින් කුපිත කරවනසුළු පුවත් වාර්තා හෙළා දැකීම සඳහා උපකාරී වනු ඇත.

- වැරදි තොරතුරු සහ මහජන විවේචන සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කළ යුතු වේ:

    - නිවැරදි තොරතුරු සහ වැරැද්ද නිවැරදි කරන අන්දමේ ක්‍රියාමාර්ග හරහා ඊට ප්‍රසිද්ධියේ ම ප්‍රතිචාර දැක්වීම

    - මහජන දුක්ගැනවිලි ඉදිරිපත් කිරීම සඳහා යන්ත්‍රණ ඇති කිරීම

    - මහජන විවේචන සතුරු හැඟීමකින් තොරව ආමන්ත්‍රණය කළ යුතු අතර, දුක්ගැනවිලි විසඳීමට අවස්ථාවක් නිර්මාණය කරන මහජනතාවගේ අත්දැකීම් අවබෝධ කර ගැනීමේ මාර්ගයක් ලෙස සැලකිය යුතුය.

